# වර්තමාන වසංගත තත්ත්වය පාලනය කිරීම සඳහා හෙළ සාම්ප්‍රදායික ඥානය උපයෝගී කොට ගත හැකි ආකාරය පිළිබඳ අධ්‍යනයක්

**[1]මධුෂිකා එස්.එච්.ටී.[3] පත්මසිරි පී.ඩී.ටී.[2]**

මානවයා සම්භවය වූ දිනයේ පටන් වර්තමානය දක්වාම මිනිසාට ඇති වූ විවිධාකාරයේ රෝග සඳහා, තමන්ගේ අද්දැකීම් මත පදනම් වී, විවිධාකාර පිළියම් මිනිසා විසින්ම නිර්මාණය කොටගෙන ඇත. පොසිල වාර්ථා වලට අනුව මානවයා විසින් ශාක කොටස් ආදිය ඖෂධ ලෙස භාවිත කිරීම ආරම්භ කොට අවුරුදු 60000ක් පමණ පැරණි බව සොයාගෙන ඇත. එමෙන්ම ශ්‍රී ලංකාව වැනි බහු සමාජීය ලක්ෂණ දරන රටක නිර්මාණය වූ හෙළ වෙද හෙදකම් රාශියක් දැක ගත හැක. ජනවහරේදී වසංගත රෝගයන් උවදුරු,පත්තිනි, වහකදුරු යනුවෙන් තෙවැදෑරුම් වේ. පැපොල, සරම්ප, කම්මුල්ගාය, වසූරිය, මැලේරියාව, කොළරාව, පාචනය ආදී වසංගත රෝගයක් වුව ද, පැතිර යාමේ දී සාම්ප්‍රධායික හෙළ දැනුම භාවිත කොට ඇත. වත්මන් වසංගත තත්ත්වය පාලනය කිරීමට හෙළ සාම්ප්‍රධායික ඥානය උපයෝගී කොට ගත හැකිද? යන්න මෙහි පර්යේෂණීය ගැටලුවයි. බටහිර වෛද්‍ය ක්‍රමය පැමිණීමත් සමග අභාවයට යමින් තිබූ දේශිය සාම්ප්‍රධායික ඥානය කැටි කොට ගත් වෙද හෙදකම් වත්මන් වසංගත තත්වයන් පාලනය සඳහා උපයෝගී කොට ගැනිම පර්යේෂණ අරමුණයි. මෙහි උපන්‍යාසය වන්නේ වත්මන් වසංගත තත්වය පාලනය කිරීමට බටහිර වෛද්‍ය විද්‍යාව මෙන්ම දේශීය පාරම්පරික ඥනය උපයෝගී කොට ගත හැකි බවයි. මෙහිදී ප්‍රාථමික හා ද්විතීක දත්ත යන දෙයාකාරයෙන්ම දත්ත රැස් කිරීම සිදු කළ අතර සම්මුඛ සාකච්ඡා, සහභාගීත්ව නිරීක්ෂණ, ප්‍රශ්නාවලී ආදී ක්‍රමවේදයන් ඔස්සේ දත්ත රැස් කිරීම සිදු කරන ලදී. මෙහි වැදගත්කම වන්නේ පැතිර යන වසංගත තත්වය පාලනය කිරීමට සාම්ප්‍රදායික හෙළ දැනුම උපයෝගි කොට ගැනීමට හැකි විමයි. එමෙන්ම අභාවයට යමින් පවතින හෙළ වෙදකමෙහි වටිනාකම තහවුරු කිරීමට හැකි වීම ද තවත් වැදගත්කමකි. කොවිඩ් 19 වසංගතයන් සමග හෙළ වෙදකම පිළිබඳ සමාජය තුළ දැඩි කතාබහකට ලක්ව තිබේ. සාම්ප්‍රධායික දැනුම පිළිබඳ අධ්‍යනය කරන විට පෙනී යන්නේ මිනිසුන් තුළ පවත්නා ජන විඥාණයයි. මෙහි දී ඖෂධ, ආහාර, අභිචාර හා සමාජ භාවිතයන් උපයෝගී කොටගෙන වසංගත රෝග නිවාරණයට සාම්ප්‍රධායික දැනුම යොදා ගත හැක. වසංගතය පාලනයට, රෝගයට ගොදුරු වූවන් ආරක්ෂා කර ගැනිමට, මානසික සුවය ඉහළ නංවා ගැනිමට සාම්ප්‍රධායික දැනුම උපයෝගි කොට ගත හැක. රෝගීන් වෙන් කර තැබීම, ඖෂධීය උණු ජලය ස්නානය, දුම් ඇල්ලිම, ප්‍රතිශක්තිය වඩවන ආහාර ගැනීම ආදී නොයෙක් වෙදහෙදකම් ඔස්සේ එම වසංගත තත්ත්වයන් පාලනයට පෙළඹී ඇත. වසංගතයන් සමග සමස්ත ලෝකයම බලපෑමට ලක් වූ අවධියක, එය පාලනයට හා සාමාන්‍ය ජන ජීවිතය යථා තත්වයට පත් කර ගැනිම උදෙසා සාම්ප්‍රදායික දැනුම උපයෝගි කොට ගත හැකි බව මෙතුළින් නිගමනය කළ හැකි ය.

**ප්‍රමුඛ පද ඃ** සාම්ප්‍රධායික දැනුම, වසංගත, පාලනය, වෙදකම

[1,2]මානව ශාස්ත්‍ර අධ්‍යනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය. madhushika199410@gmail